# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1641/42 - 2010 පෙබරවාරි 18 වැනි බ්‍රහස්පතින්දා - 2010.02.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනත**

3 වැනි වගන්තිය යටතේ නියමය

1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ තුන් වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නාගරික සංවර්ධන හා පූජා භූමි සංවර්ධන අමාත්‍ය දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන වන මම මෙහි උපලේඛනයේ I තීරුවේ නිශ්චිතව දක්වා ඇත්තා වූ ද, එම උපලේඛනයෙහි II වන අනුරූප සටහනේ සඳහන් ඉම් හා මායිම් සලකුණු නිශ්චිතව දක්වා ඇත්තා වූ ද, ප්‍රදේශය සංවර්ධනය කිරීම සඳහා සුදුසු බැව් මාගේ මතය වන හෙයින් ඒ ප්‍රදේශය ඒ වගන්තියේ කාර්ය සඳහා නාගරික සංවර්ධන ප්‍රදේශයක් විය යුතු යැයි මෙම නියමයෙන් ප්‍රකාශ කරමි.

දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන,
නාගරික සංවර්ධන හා පූජා භූමි සංවර්ධන අමාත්‍ය.

2010 පෙබරවාරි මස 05 වැනි දින,
බත්තරමුල්ලේ දී ය.

*උපලේඛනය*

*දෙයියන්දර නාගරික සංවර්ධන ප්‍රදේශය*

*I වැනි තීරුව*

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මුලටියන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ (මුලටියන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය) පිහිටියා වූ අංක 275 දෙයියන්දර ග්‍රාම නිලධාරි කොට්ඨාසය ද, අංක 272 A නෙරලම්පිටිය, අංක 275 C, ගල්ඇටුඹ, අංක 275 D මඩුවල ග්‍රාම නිලධාරි කොට්ඨාසයන් හි කොටස්වලින් සැදුම්ලත් දෙවන තීරුවේ විස්තර වන ඉම් සහ මායිම් වලින් සමන්විත වූ මුළු මහත් ප්‍රදේශය

*II වැනි තීරුව*

*උතුරට* : ඕවිලාන ඇලෙහි මධ්‍ය රේඛාව හා බරතකුඹුර ඇලේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂයෙන් ආරම්භ වී බරතකුඹුර ඇලෙහි මධ්‍ය රේඛාව ඔස්සේ නැගෙනහිර සහ උතුරු දිශානුගතව ඇදි රේඛාව කළුගලදෙණිය පොකුණේ නැගෙනහිර මායිමෙන් ගලන කළුගලදෙනිය ඇලෙහි මධ්‍ය රේඛාව හමුවන තෙක් ද, එතැන් සිට නැගෙනහිර දෙසට ලම්භකව අඳින ලද සෘජු රේඛාවක් ඔස්සේ එම ඇලෙහි වම් ඉවුර දක්වා ද, එතැන් සිට එම වම් ඉවුර ඔස්සේ උතුරු දෙසට ඇදි රේඛාව කොහිලගහදෙණිය

| *I වන තීරුව* | *II වන තීරුව* | |
|---|---|---|
| | | ඉඩමේ දකුණු මායිම දක්වා ද, එතැන් සිට එම ඉඩමේ දකුණු මායිම ඔස්සේ නැගෙනහිර දෙසට ඇඳි රේඛාව දෙයියන්දර - හඳුගල මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන තෙක් ද, එතැන් සිට එම මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ උතුර සහ ඊසාන දෙසට ඇඳි රේඛාව 3/2 දරන පිට ඇල බෝක්කුවෙහි මධ්‍ය ලක්ෂය දක්වා ද, එතැන් සිට එම ඇලේ මධ්‍ය රේඛාව ඔස්සේ ගිණිකොන දිශානුගතව කිරම ආරේ මධ්‍ය රේඛාව හමුවන තෙක් ද, |
| | *නැගෙනහිරට* : | අවසන්වරට සඳහන් කරන ලද ලක්ෂයේ සිට කිරම ආරේ මධ්‍ය රේඛාව ඔස්සේ ගිණිකොන දකුණු දිශානුගතව ඇඳි රේඛාව පණ්ඩිත පෝරුව පාලමේ (මහඔිකන්ද පාලම ) මධ්‍ය ලක්ෂය දක්වා ද, එතැන් සිට පණ්ඩිතපෝරුව මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ නැගෙනහිර දිශානුගතව ඇඳි රේඛාව දෙයියන්දර - කිරම මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන තෙක් ද, එතැන් සිට එම මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ නිරිත, දකුණු දිශානුගතව ඇඳි රේඛාව කි. මී. 1.9 ක් දුරින් පිහිටි ලක්ෂයක් දක්වා ද, |
| | *දකුණට* : | අවසන්වරට සඳහන් කරන ලද ලක්ෂයේ සිට නිරිත දිශානුගතව ඇඳි රේඛාව දෙනගම, මුලටියන මාර්ගයේ මධ්‍ය රේඛාව දක්වා ද, එතැන් සිට එම මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ දකුණු දෙසට ඇඳි රේඛාව 9/1 බෝක්කුවෙහි (කෝපිවත්ත බෝක්කුවෙහි ) මධ්‍ය ලක්ෂය දක්වා ද, එතැන් සිට කෝපිවත්ත ඇලෙහි මධ්‍ය රේඛාව ඔස්සේ නිරිත දෙසට ඇඳි රේඛාව වැවලපියද්දේ සිට ගලන අතු ගංගාවේ මධ්‍ය රේඛාව දක්වා ද, එතැන් සිට එම අතු ගංගාවේ මධ්‍ය රේඛාව ඔස්සේ උතුරු දෙසට ඇඳි රේඛාව කිරම ආරෙහි මධ්‍ය රේඛාව දක්වා ද, එතැන් සිට කිරම ආරෙහි මධ්‍ය රේඛාව ඔස්සේ වයඹ, බස්නාහිර, නිරිත, උතුර සහ බස්නාහිර දිශානුගතව ඇඳි රේඛාව සීනිපැල්ල පාලමේ මධ්‍ය ලක්ෂය දක්වා ද, |
| | *බටහිරට* : | අවසන්වරට සඳහන් කරන ලද ලක්ෂයේ සිට කිරම ආරේ මධ්‍ය රේඛාව ඔස්සේ වයඹ දිශානුගතව ඇඳි රේඛාව ඕවිලාන ඇලෙහි මධ්‍ය රේඛාව හමුවන තෙක් ද, එතැන් සිට එම ඇලෙහි මධ්‍ය රේඛාව ඔස්සේ උතුර, ඊසාන හා වයඹ දිශානුගතව ඇඳි රේඛාව ආරම්භක ලක්ෂය හමුවන තෙක් ද වේ. |

03-156

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.